**ශීර්ෂය 408 වේවැල් ,පිත්තල,මැටි,ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වේවැල් ,පිත්තල,මැටි,ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වේවැල්,පිත්තල,මැටි,ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 අගෝස්තු 13 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 14 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වේවැල් ,පිත්තල,මැටි,ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

අංක 2187/27 හා 2020 අගෝස්තු 09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වේවැල් ,පිත්තල , මැටි, ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපනය කළ බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැක. තවද ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොවූ බැවින් මාගේ නිර්දේශද ඉදිරිපත් කර නොමැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

---

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 2187/27 හා 2020 අගෝස්තු 09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශය ස්ථාපනය කළ බැවින් ඉකුත් වර්ෂ ශේෂ නොමැති වුවද , මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉකුත් වර්ෂය යටතේ ශේෂයන් දක්වා තිබුණි. | ශේෂ දැක්වීම අතපසුවීමකින් සිදුව ඇති බව දන්වා ඇත. | අමාත්‍යාංශය ස්ථාපනය කිරීම 2020 අගෝස්තු මාසයේදී සිදු වූවක් බැවින් ඉකුත් වර්ෂයේ ශේෂ පැවතීමක් සිදුවිය නොහැක. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

---

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශ ගිණුම් අනුව අත්තිකාරම් අයකර ගැනීම් හා ගෙවීම් පිළිවෙලින් රු.70,175,824 ක් හා රු.72,301,579 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු. 2,049,379 ක් හා රු. 4,175,133 ක් ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී අවසන් මාස 4 සඳහා අත්තිකාරම් ගිණුමට මුදලින් ලද හා මුදලින් ගෙවන ලද ප්‍රමාණයන් පමණක් ගෙන ඇති බව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිත කළයුතු ආකෘතිපත්‍ර අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය දළ පදනමින් පිළියෙල කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන හා මූලධන වැය විෂයන් 09ක් හා 11ක් සඳහා සලසා තිබූ පිළිවෙලින් එකතුව රු. 7,330,000 ක ප්‍රතිපාදන වලින් රු. 1,417,347 ක් හා රු. 4,023,259 ක් වශයෙන් රු. 5,440,606 ක් උපයෝජනය කර නොතිබුණි. එය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයන් සියයට 34 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | නිරීක්ෂණ පිළිගන්නා බව දන්වා තිබුණි. | මු. රෙ. 50 (11) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අදාළව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2020 ඔක්තෝබර් 09 දිනැතිව නිකුත් කළ මාර්ගෝපදේශයේ අංක 06 හි 3.4 වගන්තිය ප්‍රකාරව, සටහන් අංක III යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් ශීර්ෂවලට අදාළව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ විය යුතු වුවද, එම ලේඛන දෙක අතර, රු. 4,272,846 ක වෙනසක් පැවතුණි. | විද්‍යා සම්පත් මධ්‍යස්ථානවල පෙර වර්ෂයන්ට අදාළ බැරකම් නියමිත දිනට පෙර වාර්තා කරන මෙන් දැන්වූවද නියමිත පරිදි නොලැබීම හේතුවෙන් හා ඇතැම් බැරකම්වලට අදාළ වැය විෂයයන්ගේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අදාළ දිනට පෙර CIGAS වැඩසටහන මඟින් භාණ්ඩාගාරයට වාර්තා කිරීමට නොහැකි විය. එහෙත් එකී දිනයට පසුව වුවද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට ප්‍රථම අප වෙත වාර්තා වී තිබූ බැරකම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශය මඟින් ඉදිරිපත්කිරීමට කටයුතු කරන ලදි. එබැවින් භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ වෙනසක් පෙන්නුම් කෙරේ. | මාර්ගෝපදේශයේ අංක 06 හි 3.4 වගන්තිය ප්‍රකාරව, සටහන් අංක III යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් ශීර්ෂවලට අදාළව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව වැය විෂයන් සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹිය නොහැකි වුවද, පුනරාවර්තන වැය විෂයන් 09 ක ඉතිරිය රු. 217,526 ක් ඉක්මවා එකතුව රු. 3,854,576 ක් වූ බැරකම්වලට එළඹ තිබුණි. | වර්ෂයේ මාස 04 ක කාලයකට පමණක් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර දුන් අතර විදාතා මධ්‍යස්ථානවලට අදාළව වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලයට අදාළව නිරවුල් නොකල බිල්පත් රාශියක් ගෙවීම් කිරීමට සිදුවිය . මෙම තත්ත්වය මත ඉතිරි වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා බැරකම් ඇති වීමට හේතු වී ඇති බව දන්වා තිබුණි. | වැය විෂය සඳහා සලසා තිබෙන ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම නොකළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල රු. 142,612 ක් වූ බැරකම් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශයේ සටහන් අංක III යටතේ වන බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදාතා සම්පත් මධ්‍යස්ථාන දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පිහිටුවා ඇති අතර අමාත්‍යාංශය අලුතින් පිහිට වූවක් බැවින් තොරතුරු ලබාගැනීමේ දුෂ්කරතා ද පැවතිණ. ඒ අනුව නියමිත පරිදි බැරකම් වාර්තා නොවීම හේතුවෙන් වාර්තා කිරීම සිදු කළ නොහැකි වුවද පසුව හඳුනාගත් බැරකම් වුවද අදාළ කාර්යාල කටයුතු පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මත නිරවුල් කිරීමට සිදුවී ඇත. | වර්ෂයට අදාළ සියලු බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වේ. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 04 ඡේදයේ දක්වා ඇති පරිදි නීතිපතිගේ උපදෙස් මත කටයුතු කළ යුතු වුවද, එකතුව රු. 451,582 ක් වූ ණය ශේෂ සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | ණය ශේෂයන් අයකර ගැනීම සම්බන්ධයෙන් පෙර පැවති අමාත්‍යාංශයේ නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් අදාළ ලේඛණ පරීක්ෂාකර බලා ගත යුතු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතිවන බව දන්වා තිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 04 ඡේදයේ දක්වා ඇති පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අයවැය චක්‍රලේඛ අංක 118 හි 1.1.7 ඡේදය පරිදි නිලධාරීන් මාරු වී පැමිණ මාස 02 ක් ගතවීමෙන් පසු හෝ නිලධාරියෙක් මාරු වී ගොස් මාස 03 ක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර, නිරවුල් නොවූ ණය ශේෂ නොතිබිය යුතු වුවද, රු.248,701ක ණයගැති ශේෂයක් මෙතෙක් නිරවුල් කර නොතිබුණි. | අදාළ තොරතුරු පෙර පැවති නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපයුම් අමාත්‍යාංශයෙන් ලබාගෙන එම ණය ශේෂයන් නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | 2004 ඔක්තෝබර් 11 දිනැති අයවැය චක්‍රලේඛ අංක 118 හි නියමයන් අනුව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දැව හා දැව ආශ්‍රිත නිර්මාණ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට සැලසුම් කර රු. 2,470,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද ඉන් උපයෝජනය කර තිබුණේ රු.470,125 ක් පමණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ සැලසුම් කළ පරිදි කටයුතු කිරීමට රටතුළ පැවති වසංගත තත්වය හමුවේ නොහැකිවී තිබූ අතර 2021 ජූනි 30 වන විටත් අමාත්‍ය මණ්ඩල අනුමැතියට පත්‍රිකාවක් පමණක් ඉදිරිපත් කර තිබුණි. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ මොරටුව විශ්වවිද්‍යාලය සම්බන්ධ කරගනිමින් නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ COSTI ආයතනය මඟින් හසුරුවන ලද දැව ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය යන විෂය පථය මෙම අමාත්‍යාංශයට පවරා ඇත. තවද එම විශ්වවිද්‍යාලයන් මගින් කරන ලද කාර්යයන් සඳහා වූ වවුචර 2020. 12.28 දිනට පෙර අමාත්‍යාංශයට ලබා දීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇතත් ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම අපේක්ෂිත කාලරාමු තුළ කාර්යයන් කිරීම ගැටලු සහගත වූ බැවින් අමාත්‍යාංශය මඟින් ගෙවීම් කටයුතු සිදු නොකරන ලද බව දන්වා තිබුණි. | ව්‍යාපෘතිය එක් එක් අනු කාර්යයන් මඟින් හඳුනාගැනීම හා ඒ සඳහා වියදම් හා කාල ඇස්තමේන්තු අනුමත කර ගැනීම තුළින් සිදුවන ප්‍රමාදයන් වළක්වාගත යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2030 න්‍යාය පත්‍රයට අනුව 2030 වසරවන විට ක්‍රියාත්මක කිරීම සඳහා අරමුණු 04ක් අමාත්‍යාංශය හඳුනාගෙන ඇතත්, එම අරමුණු ඉටුකරගැනීම සඳහා වූ ඉලක්ක නිශ්චිතව දක්වා නොතිබුණි. | අරමුණු ඉටුකර ගැනිම සඳහා අමාත්‍යාංශය විසින් ඉලක්ක හඳුනාගෙන තිබුණද, නිශ්චිතව එම ඉලක්කයන් සඳහන් කිරීමට නොහැකි වීම පිළිබඳව එකඟ වේ. නව අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිත වී මාස තුනක් වැනි කෙටි කාලයක් සඳහා වෙන් කෙරුණ ප්‍රතිපාදන මඟින් එම ඉලක්කයන් ලඟා කර ගැනීමේදී අමාත්‍යාංශය සතුව ප්‍රමාණවත් දත්ත නොතිබීම මත ඉලක්කයන් නිශ්චිතව සහ සංඛ්‍යාත්මකව ප්‍රකාශ කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | හඳුනාගත් අරමුණු ඉටුකරගැනීම සඳහා වූ ඉලක්ක නිශ්චිතව හඳුනාගැනීම කළයුතුයි |

| | | | |
|---|---|---|---|
| (ආ) | හඳුනාගත් අරමුණු ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනබැලීමට පාදක වර්ෂයක් හා එම වර්ෂයේ පැවති තත්වය පාදක දත්ත ලෙස හඳුනාගත යුතු වුවත් එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේ ලබාගත් ප්‍රගතිය සියයට 0 ත් සියයට 49 ත් අතරවන බව වාර්ෂික කාර්යය සාධන වාර්තාවේ දැක්වීම නිසා එම ප්‍රගති අගයන්හි නිරවද්‍යතාව තහවුරු කරගත නොහැකි විය. | අමාත්‍යාංශය විසින් හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැන බැලීමට පාදක වර්ෂයක් හා ඒ පාදක වර්ෂයේ දත්ත මත සමාලෝචිත වර්ෂයේ ප්‍රගතිය සඳහන් කළ යුතු වුවත් එසේ කිරීමට නොහැකි වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් කරුණු සම්බන්ධයෙන් මූලික දත්ත පද්ධතියක් අමාත්‍යාංශය සතු නොවීම නිසාය. එහෙත් මේ වන විට අදාළ දත්ත ඒකරාශී කරමින් මූලික දත්ත පද්ධතියක් සකස් කිරීමේ කටයුතු ආරම්භකර ඇති බව සඳහන් කර තිබුණි. | හඳුනාගත් අරමුණු ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනබැලීමට පාදක වර්ෂයක් හා එම වර්ෂයේ පැවති තත්වය පාදක දත්ත ලෙස හඳුනාගත යුතුයි. |

## 5. මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලයේ සංයුතිය බැලීමේදී ජ්‍යෙෂ්ඨ හා ද්විතියික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු පිළිවෙලින් 08 ක් හා 107ක් පැවති බව නිරීක්ෂණය විය. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇත. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුයි. |